# 5 අලුත් අවුරුද්ද

'සිංහල හා හින්දු අලුත් අවුරුද්ද අපගේ සංස්කෘතික උත්සව අතර ප්‍රධාන තැනක් ගනී. මේ පාඩමට අයත් වන්නේ සිංහල අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් පිළිබඳ විස්තරයකි.

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද අපගේ ජාතික උත්සව අතර ප්‍රධාන තැනක් ගනී. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට පැමිණීම 'අලුත් අවුරුද්ද' උදාවීම ලෙස සලකයි. අලුත් අවුරුද්ද උදා වන්නේ සෑම වර්ෂයක ම අප්‍රේල් මාසයේ 13 හෝ 14 වැනි දිනක ය. අලුත් අවුරුද්ද හා සම්බන්ධ චාරිත්‍ර රාශියක් ම පවතී. සිංහල අවුරුදු කාලයට පැවැත්වෙන සිරිත් විරිත් සියල්ලම තුන් කොටසකට බෙදා වෙන් කළ හැකි ය.

පළමු වන කොටසට පරණ අවුරුද්දේ පවත්වන සිරිත්විරිත් ද, දෙවන කොටසට 'නොනගතයේ' දී පවත්වන සිරිත්විරිත් ද, තුන්වන කොටසට අලුත් අවුරුදු දවසේ දී හා ඊට පසුව පැවැත්වෙන සිරිත්විරිත් ද අයත් වෙයි.

අලුත් අවුරුද්දට සූදානමක් වශයෙන් ගෙවල්දොරවල් ශුද්ධපවිත්‍ර කිරීම ගැමියන්ගේ සිරිතකි. මේ කටයුත්ත වැඩි වශයෙන් පැවරෙන්නේ ගැමි කතුන්ට ය.



පරණ අවුරුද්දේ දී පවුලේ හැම දෙනාට ම පාහේ නොයෙක් කටයුතු පැවරෙයි. පිරිමි උස් ගස් සොයා ඔන්චිලි බඳිති. ගමේ තරුණියෝ රබාන එළියට ගෙන තමන්ගේ හපන්කම් දක්වන්නට පටන් ගනිති.

සිංහල අවුරුදු කාලයට නගරබද ව වුව දක්නට ලැබෙන සිරිතකි, වැඩිහිටියන්ට බුලත් දීම. දරුවෝ බුලත් අත් රැගෙන මාපියන් දකීමට මුල් ගෙදරට යති. බුලත් අත දෙමාපියන්ට පිළිගන්වා පරණ

අවුරුද්දේ යම් කිසි අත් වැරැද්දක් හෝ සිත් අමනාපයක් හෝ වූයේ නම් ඊට සමාවන මෙන් ඉල්ලා සිටිති.

සිංහල අවුරුද්ද හා සම්බන්ධ තවත් සිරිත්විරිත් විශේෂයක් 'නොනගතය' කාලයේ දී ඉටු කෙරයි. 'නොනගතය' යනු පරණ අවුරුද්දටත්, අලුත් අවුරුද්දටත් අයත් නැති කාල පරිච්ඡේදයකි. මේ කාලය තුළ ගැමියෝ, දරුමල්ලන් ද කැටුව පන්සල් යති. ඔවුහු බුදුන් වැඳ දෙවියන්ට පින් දී ආරක්ෂාව සලසා ගනිති. නොනගතය කාලයෙහි දී සිදුවන සිරිත් විරිත් පළාතෙන් පළාතට වෙනස් වේ. නොනගත කාලය තුළ ළිඳෙන් ජලය නොගැනීම, ඇතැම් පළාතක ඇති විරිතකි.



නොනගතයේ දී අනුන්ගේ ගෙවල්වලට යෑමෙන් වැළකීම ද සමහර පළාතක අනුගමනය කරන විරිතකි.

අලුත් අවුරුද්දේ වැදගත්ම චාරිත්‍රය නම් සුබ මොහොතින් ළිප් බැඳ ගිනි මොළවා ආහාර පිසීමයි. මේ සඳහා පිළියෙල කරන්නේ කිරෙන් පිසූ බතකි. මේ සඳහා ගන්නේ අලුත් අස්වැන්නෙන් ලබා ගත් වී ය.

අලුත් අවුරුද්දේ සිදු කරන ඊළඟ වැදගත් දේ ගනුදෙනු කිරීමයි. සමහර පළාත්වල ළිඳත් සමඟ ගනුදෙනු කිරීම සිදු වෙයි.

අලුත් අවුරුද්දේ ඉසතෙල් ගෑම ද වැදගත් චාරිත්‍රයකි. මෙය සුබ නැකතකට සිදු කරන අතර, මෙහි දී ඉසතෙල් ගෑම සිදු කරන්නේ පන්සලේ හාමුදුරුවන් හෝ ගමේ වෙද මහත්තයා හෝ පාසලේ ලොකු මහත්තයා ය.



සිංහල අලුත් අවුරුදු "සඳ බැලීම" ද පැරණි සිරිත්විරිත් අතරට අයත් ය.

## ක්‍රියාකාරකම්

1. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. පාඩමේ සඳහන් අලුත් අවුරුදු චාරිත්‍ර මොනවාද?

   ii. සිංහල අවුරුදු කාලයට පැවැත්වෙන සිරිත් විරිත් තුන් කොටසකි. ඒවා මොනවාද?

   iii. සිංහල අවුරුදු කාලයට ගම්වල පැවැත්වෙන ජන ක්‍රීඩා 3ක් නම් කරන්න.

   iv. අලුත් අවුරුදු සමයේ දී ඉටු කරන චාරිත්‍ර මොනවාද?

   v. 'නොනගතය' යනු කුමක්ද?

**භාෂා භාවිතය**

1. නිවැරදි පදය වරහන් තුළින් තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

   i. සූර්යයා ........................................ රාශියෙන් මේෂ රාශියට ගමන් කරයි. (මිථුන, මීන)

   ii. සිංහල දෙමළ අලුත් අවුරුද්ද ප්‍රධාන........................................ උත්සවයකි. (ජාතික, ආගමික)

   iii. අවුරුදු ද අපි වැඩිහිටියන්ට ........................................ දී වැන්දෙමු. (බුලත්, මල්)

   iv. අලුත් අවුරුදු ........................................ නියම ආකාරයට ඉටු කළ යුතුය. (චාරිත්‍ර, නීති)

   v. අලුත් අවුරුද්දට සූදානමක් වශයෙන් ගෙවල් දොරවල් ................................ කරනු ලැබේ. (පිරිසුදු, සූදානම්)

2. මේ වාක්‍ය නිවැරැදි නම් ( ✓ ) ලකුණ ද, වැරැදි නම් ( ✗ ) ලකුණ ද යොදන්න.

   i. සිඟන්නා සිඟමන් යදිමින් කඩයට ඇතුළු වූවාය. (   )

   ii. අම්මා ඇඳුමක් මැසීමට රෙදි කපන්නීය. (   )

   iii. අපි ඔබට පිහිට වන්නෙමු. (   )

   iv. මව, තම දියණිය ගැන ආඩම්බර වූවේය. (   )

   v. නුඹලා ගමට යන්නෙහි. (   )

3. පහත දැක්වෙන යෙදුම්වල අදහස කුමක් ද?

   i. නොනගතය

   ii. බුලත් දීම

   iii. ගනුදෙනු කිරීම

   iv. සුබ මොහොත

   v. අලුත් අස්වැන්න

4. හිස් තැනට ගැළපෙන වචනය වරහනින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

   i. ...................................................................... ඔබ හඳුනමි (මා / මම)

   ii. ...................................................................... කොහි වෙසෙත් ද? (නුඹ / නුඹලා)

   iii. ...................................................................... සාහිත්‍ය සමිතියේ දී කතාවක් පැවැත්වීමි (මම / මා)

   iv. ...................................................................... දළඳා මාළිගාව නැරඹීමට ගියෙමු (අප / අපි)

   v. ...................................................................... සතුව කිසිදු ධනයක් නැත (අප / අපි)

5. හිස්තැන් පුරවන්න.

   i. ක...........................නය (ඵ / ත)

   ii. ................................නිජ (ඛ / ක)

   iii. වර්...........................නය (ධ / ද)

   iv. මර්...........................නය (ධ / ද)

   v. .................................ණ්ඩය (ඛා / භා)

6. පහත සඳහන් වචනවල තේරුම් ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

   i. මිනි
   ii. යහන
   iii. සූර්යයා
   iv. කුඩු තනාලා
   v. නුබ

7. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ පද වරහන් තුළින් තෝරා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

   i. ...................................... රළ ගුමු නද දෙති. (මී මැස්සා / බිඟු)

   ii. රළ ...................................... තරඟයට මෙන් වෙරළ බලා ඇදෙයි. (පෙළ / සමූහයෝ)

   iii. ...................................... අකුරු උගනිති. (ළමයා / ළමා පෙළ)

   iv. ඇත් ...................................... වනාන්තරයට පලා ගියහ. (පැටියා / රංචුව)

   v. මුව ...................................... තණකොළ උලා කති. (රංචුව / පැටියා)

## පැවරුම

1. ඔබ අවුරුද්ද ගත කළ ආකාරය පිළිබඳ රචනයක් ලියන්න.

2. ‘අපේ පාසලේ පැවැති සිංහල හා හින්දු අලුත් අවුරුද්ද’ මැයෙන් පුවත්පතට වාර්තාවක් සකස් කරන්න.